# 10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## සබඳතා රකින මිනිස් යුතුකම්



අන්තර්ගතය - සාගරිකා වික්‍රමආරච්චි - බප/කැල/කිරිල්ලවල ම.ම.වි.
සැකසුම - ටී.එම්.ගයාත්‍රී ලක්මාලි - බ/පුස්සැල්ලාකන්ද මහා විද්‍යාලය , පතනවත්ත

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk




- මෙහි දැක්වෙන්නේ මකුළු දැලක ආකෘතියකි.
- මකුළු දැල සමතුලිතව තිබේ.
- එහි එක් කොනක සමතුලිත බව බිඳුනු විට පද්ධතියම අකර්මන්‍ය වේ.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකු ලෙස ඔබ


නිවසේදී දෙමාපියන්ට දරුවෙකි


පාසලේදී ගුරුභවතුන්ට ශිෂ්‍යයෙකි


මිතුරන් අතර මිතුරෙකි


පන්සලේදී භික්ෂූන් වහන්සේලාට ගිහි දරුවෙකි.


Copyright © e-thaksalawa.moe.gov.lk

- දුවේ, පුතේ දැන් ඔබ ගැන මදකට සිතන්න.
- ඒ ඒ අවස්ථාවන්හි ඔබගේ භූමිකාව පිළිබඳ මෙනෙහි කරන්න.
- මෙම අන්‍යෝන්‍ය සබඳතා , සමාජ කොට්ඨාස එකිනෙක බැඳ තබන බව ඔබ දන්නවාද?
- දෙමාපියන්ට දරුවෙකු ලෙස ඔබගේ යුතුකම්ද මිතුරන් ඉදිරියේ මිතුරකු ලෙස යුතුකම්ද ඔබට ඉටු කල හැකිද?
- එසේ නම් අදාල භූමිකාවට ගැළපෙන ලෙස ඔබගේ යුතුකම් ඉටුකළ යුතු බව ඔබට වැටහේද?
- අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ එම යුතුකම් පිළිබඳව අපට උගන්වා ඇත.
- සිඟාල නම් ගෘහපතියා දිසා නමස්කාරය සිදු කරන කළ, බුදුරජාණන් වහන්සේ විසින් සදිසා නමස්කාරය හඳුන්වා දුන්හ.
- එම කරුණු අඩංගුවී තිබෙන්නේ සිඟාලෝවාද සූත්‍රය තුළයි.


Copyright © e-thaksalawa.moe.gov.lk





Copyright © e-thaksalawa.moe.gov.lk

# දෙමාපිය - දූදරු යුතුකම්

## දරුවන් විසින් දෙමාපියන්ට ඉටුකළ යුතු යුතුකම්

- දෙමාපියන් පෝෂණය කිරීම
- දෙමාපියන්ගේ කටයුතු කරදීම
- පවුලේ ගෞරවය රැකදීම
- දෙමාපියන්ගෙන් ලද දායාද ආරක්ෂා කිරීම
- දෙමාපියන් මියගිය පසු පිං අනුමෝදන් කිරීම

## දෙමාපියන් විසින් දරුවන්ට ඉටුකළ යුතු යුතුකම්

- දරුවන් පාපයෙන් වලක්වා ගැනීම
- ඔවුන් යහපතෙහි පිහිටුවීම
- ශිල්ප උගැන්වීම
- සුදුසු කල යුග දිවියකට පත් කිරීම
- සුදුසු කල්හි දායාද පැමිණවීම


Copyright © e-thaksalawa.moe.gov.lk

## ගුරු - ශිෂ්‍ය යුතුකම්

**ශිෂ්‍යයන් විසින් ගුරුවරුන්ට කළ යුතු යුතුකම්**

- ගුරුවරයා දැක හුනස්නෙන් නැගිටීම
- අවශ්‍ය උපස්ථාන කිරීම
- අවවාද අනුශාසනාවලට මැනවින් සවන්දීම
- අවශ්‍ය කටයුතු සිදුකර දීම
- හොඳින් ශිල්ප හැදෑරීම

**ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට කළ යුතු යුතුකම්**

- ශිෂ්‍යයා මැනවින් හික්මවීම
- මනාලෙස ශිල්ප ඉගැන්වීම
- දන්නා සියලු කරුණු ගුරු මුෂ්ටි නොතබා කියාදීම
- සිය මිතුරන්ට ශිෂ්‍යයා හඳුන්වා දීම
- සෑමවිටම ශිෂ්‍යයාට රැකවරණය සැලසීම


Copyright © e-thaksalawa.moe.gov.lk

## සේව්‍ය - සේවක යුතුකම්

**සේවකයා විසින් සේව්‍යාට ඉටුකළ යුතු යුතුකම්**

- නියමිත පරිදි වැඩට පැමිණීම
- නියමිත වේලාවට කලින් නොයාම
- සොරකම් නොකිරීම
- අවංකව සේවය කිරීම
- ස්වාමියාගේ ගුණකීම

**සේව්‍යයා විසින් සේවකයාට ඉටුකළ යුතු යුතුකම්**

- සේවකයාගේ ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීම
- සුදුසු පරිදි ආහාර හා වැටුප් ලබාදීම
- සෞඛ්‍යය පහසුකම් ලබාදීම
- විශේෂ ලාභ වරප්‍රසාද සමසේ බෙදාහැරීම
- සුදුසු අවස්ථාවන්හිදී විවේක ලබාදීම


Copyright © e-thaksalawa.moe.gov.lk

## ස්වාමි - භාර්යා යුතුකම්

**ස්වාමියා විසින් බිරිඳට ඉටුකළ යුතු යුතුකම්**

- ගරු කිරීම
- අවමන් නොකිරීම
- අන් අඹුවන් වෙත නොයෑම
- නිවසේ වගකීම් පවරාදීම
- වස්ත්‍රාභරණ සපයාදීම

**බිරිඳ විසින් ස්වාමියාට ඉටුකළ යුතු යුතුකම්**

- නිවසේ කටයුතු මැනවින් සංවිධානය කිරීම
- පිරිවර ජනයාට සංග්‍රහ කිරීම
- අන් පුරුෂයන්ගේ පහස නොපැතීම
- උපයන ලද ධනය රැකීම
- දක්ෂව අනලස්ව කටයුතු කිරීමෙන්


Copyright © e-thaksalawa.moe.gov.lk

## ගිහි - පැවිදි යුතුකම්

ගිහියන් විසින් පැවිදි උතුමන්ට කළ යුතු යුතුකම්

- තිදොරින්ම මෛත්‍රී සහගතව කටයුතු කිරීම
- නිවසට පැමිණි විට සතුටින් පිළිගැනීම
- ආමිෂයෙන් සංග්‍රහ කිරීම.

පැවිදි උතුමන් විසින් ගිහියන්ට කළ යුතු යුතුකම්

- සිය දායක පක්ෂය පවින් වැලැක්වීම
- යහපත් ක්‍රියාවල යෙදවීම
- යහපත් සිතින් අනුකම්පා කිරීම
- නොඇසූ දේ අහන්නට සැලැස්වීම
- ඇසූ දේහි සැක දුරුකිරීම
- සුගති මාර්ගය කියාදීම


Copyright © e-thaksalawa.moe.gov.lk

# මිතුරු - මිතුරු යුතුකම්

**මිතුරා විසින් ඉටුකළ යුතු යුතුකම්**

- අවශ්‍ය දේ දීම
- ප්‍රිය වචන කථා කිරීම
- අර්ථ සිද්ධිය පිණිස කටයුතු කිරීම
- සමානාත්මතාවයෙන් හා නොරැවටීම

**මිතුරා වෙත ඉටුකළ යුතු යුතුකම්**

- දුසිරිතෙහියෙදී ප්‍රමාදයට පත්වූ මිතුරා රැකදීම
- ඔහුගේ ධනය ආරක්ෂා කරදීම
- බියෙහිදී නිර්භයතාවය ඇතිකරදීම
- ආපදාවේදී අමතක නොකිරීම
- මිතුරාගේ අඹුදරුවන්ට ගෞරවයෙන් සැලකීම


Copyright © e-thaksalawa.moe.gov.lk

සිඟාලෝවාද සූත්‍රයට අනුව, ස්වාමි - භාර්යා යුතුකම් ඉටුවීම මඟින් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමට හැකි වේ.

මේ සඳහා බිරිඳ සහ සැමියා තුළ,

- සම සීල
- සම ශ්‍රද්ධා
- සම ත්‍යාග
- සම ප්‍රඥා තිබිය යුතුය.

ස්වාමි - භාර්යා යුතුකම් ඉටු නොවන්නේ නම්,

- පවුල විසිරී යාම.
- දරුවන් අනාථ වීම.
- සතුරන් ඇතිවීම.
- කල කෝලාහල ඇති වීම.
- ජීවිත අනතුරු සිදුවීම වැනි ගැටළු ඇති විය හැක.




Copyright © e-thaksalawa.moe.gov.lk



සිඟාලෝවාද සූත්‍රයේ , සදිසා හි උතුරු දිශාව නියෝජනය කරන කළණ මිතුරන් සිව්දෙනෙකු හා පාප මිත්‍ර ප්‍රතිරූපකයන් සිව්දෙනෙකු පෙන්වා දී තිබේ.

### කළණ මිතුරන් සිව්දෙනා

1. උපකාරක මිතුරා - සැමවිටම උදව්වට පැමිණේ
2. සමාන සුඛ දුක්ඛ මිතුරා - දුකේදී මෙන්ම සැපේදීද එකට සිටියි.
3. අත්ථක්ඛායි මිතුරා - යහපත උදෙසාම කටයුතු කරයි.
4. අනුකම්පක මිතුරා - සැම විටම අනුකම්පාවෙන් උදව් කරයි.

### මිත්‍ර ප්‍රතිරූපකයන් සිව්දෙනා

1. අඤ්ඤදත්ථුහර - මිතුරාගෙන් යමක් ලබා ගැනීමට පමණක් පැමිණෙයි
2. වචීපරම - වචනයෙන් පමණක් උදව් කරයි
3. අනුප්පියභාණී - හොඳ සහ නරක දෙකම අනුමත කරයි
4. අපාය සහයක - පස් පවට යොමු කරවයි


Copyright © e-thaksalawa.moe.gov.lk

## සදිසා වලින් පෙන්වා දී ඇති සමස්ථ යුතුකම් ඉටුකරන සමාජය තුළ

- ✓ අයිතිවාසිකම් නොව , යුතුකම් පෙරදැරිව කටයුතු කරන සමාජයක් බිහිවෙයි.
- ✓ සුහදත්වය සහ එකමුතු බව ඇති වෙයි.
- ✓ අන්‍යෝන්‍ය වශයෙන් විශාල බැඳීමක් ගොඩනැගෙයි.
- ✓ අන්‍යෝන්‍ය විශ්වාසය හා අවබෝධය ගොඩනැගෙයි.
- ✓ සමාජ සදාචාරය ගොඩනැගෙයි.





Copyright © e-thaksalawa.moe.gov.lk

# සිඟාලෝවාද සූත්‍රයෙහි අන්තර්ගතය

- **තුදුස් ලාමක ධර්ම(14)**
  - **සතර අගති**
    - ඡන්දය
    - ද්වේශය
    - භය
    - මෝහය
  - **සතර කර්ම ක්ලේශ**
    - ප්‍රාණඝාතය
    - අදත්තාදානය
    - කාම මිත්‍යාචාරය
    - මුසාවාදය
  - **භෝග විනාශ මුඛ (06)**
    - මත්වතුර පානය
    - අවේලාවේ වීථි සංචාරය
    - නැටුම් ගැයුම් නිතර බැලීම
    - සූදුව
    - පාපමිත්‍ර සේවනය
- **දස අලාමක ධර්ම(10)**
  - **සතර සංග්‍රහ වස්තු**
    - දානය
    - ප්‍රියවචනය
    - අර්ථචර්යාව
    - සමානාත්මතාව
  - **සදිසාවන්**
    - පුබ්බ දිසාව
    - දක්ඛිණ දිසාව
    - පච්ඡිම දිසාව
    - උත්තර දිසාව


Copyright © e-thaksalawa.moe.gov.lk

# අභ්‍යාස

- යහපත් සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම පැහැදිලි කරන සූත්‍රය
(සිඟාලෝවාද සූත්‍රය / අග්ගඤ්ඤ සූත්‍රය)

- සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ
  1. රජගහනුවර වේළුවනාරාමයේ වැඩවසන සමයේ ය.
  2. කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේ වැඩවසන සමයේ ය.
  3. විශාලාමහනුවර වාලුකාරාමයේ වැඩවසන සමයේ ය.
  4. බරණැස්නුවර ඉසිපතනාරාමයේ වැඩවසන සමයේ ය.

- පහත ගාථාව සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.
(පිතා, පුබ්බා, දක්ඛිණා, පච්ඡා, උත්තරා, කම්මකරා, සමණ, ඒතා, නමස්සෙය්‍ය,ගිහි)

| | | |
|---|---|---|
| මාතා .......... දිසා .................. | - | ආචරියා .......................... දිසා |
| පුත්ත දාරා දිසා ...................... | - | මිත්තාමත්තාච ...................... |
| දාස ............................ භෙට්ඨා | - | උද්ධං ..................... බ්‍රාහ්මණා |
| ............ දිසා .......................... | - | අලමත්තො කුලේ..................... |


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk